# උඩගම්පහ කෝරළයේ හුරීකඩුව ගල්පිහිල්ල (සංස්කෘතික උරුම වටිනාකම් පිළිබඳ අධ්‍යනයක්)

අබේසේකර එච්.එම්.එච්.එච්.[1]

හුරීකඩුව ගල්පිහිල්ල, මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩගම්පහ කෝරළයේ පිහිටා තිබේ. හුරීකඩුව ග්‍රාමයේ පිහිටි පිටවල කුඹුරු යායට මැදිව ගලා යන ස්වාභාවික ජල උල්පතෙන් ජලය ලබා ගැනීම සඳහා මෙම පිහිල්ල නිර්මාණය කර ඇත. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන්නේ පාතදුම්බර උඩගම්පහ කෝරළේ නිර්මිත ඓතිහාසික ජල මූලාශ්‍රය හඳුනා ගැනීමේදී හුරීකඩුව ගල්පිහිල්ල සහිත උල්පතට හිමිවන ස්ථානය කෙබඳුද යන්න හඳුනා ගැනීමයි. ගල්පිහිල්ල උල්පත හා බැඳුණු සංස්කෘතික සන්දර්භය අධ්‍යනය කිරීම මෙහි අරමුණ වේ. දත්තරැස් කිරීම සඳහා ඓතිහාසික මූලාශ්‍රය පරිශීලනය, සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර නිරීක්ෂණය, කේවල අධ්‍යනය ආදී ගුණාත්මක දත්ත රැස්කිරීමේ විධික්‍රමය යොදා ගැණිනි.ග්‍රැනයිට් පාෂාණයෙන් නිර්මිත ගල්පිහිල්ල මීටර් 2.55ක් පමණ දිගින් යුක්තය. එහි පළල සෙ.මී.32ක් පමණ වන අතර පිහිල්ලේ ඝනත්වය සෙ.මී.15කි. ගල්පිහිල්ල සහිත දිය උල්පතෙහි උපයෝගීතාව පිළිබඳ අදහස් කීපයක් පවතී. දිය උල්පතට මීටර් 50ක් පමණ දුරින් පුරාණ ටැම්පිට විහාරයක් පිහිටා තිබේ. විහාරයේ පූජනීය හා අර්ධ පූජනීය ජල අවශ්‍යතා සඳහා පිහිල්ල භාවිතා කළ බව කියවේ. එම ටැම්පිට විහාර පරිශ්‍රය වර්තමානයේ දක්නට නොලැබෙන අතර එහි දැනට ශේෂව පවතින්නේ අවශේෂ කීපයක් පමණි. දිය උල්පතට මීටර් 200ක් පමණ ඊසාන දිගින් පිහිටි මීගස්තැන්න වලව්ව පසුකාලීනව විහාරස්ථානයක් බවට පත්ව තිබේ. නව විහාරස්ථානය හඳුන්වන්නේ ද හුරීකඩුව ගල්පිහිල්ල රජමහා විහාරස්ථානය යනුවෙනි. ටැම්පිට විහාර පරිශ්‍රය ගරා වැටීමට ලක්වීම හේතුවෙන් නව විහාරස්ථානය ගොඩනගන්නට ඇති බව උපකල්පනය කළ හැකිය. මෙම විහාරස්ථානයේ ද වැඩවාසය කළ භික්ෂූන් වහනසේලාගේ ජල අවශ්‍යතා සඳහා උල්පත යොදාගෙන තිබේ. විහාරස්ථානයේ පරිභෝජනයෙන් පසුව ගලායන ජලය බණ්ඩාර ඇළ සහ රත්මල් ඔයට සම්බන්ධ කර ඇත. ඔය ආශ්‍රිතව පුරාණයේ ගම් වැවක් තිබූ බවට ද අදහසක් පවතී. වර්තමානයේ ඒ ආශ්‍රිතව සිදුකර ඇති වගා කටයුතු හේතුවෙන් වැවේ සාධක දක්නට නොලැබේ. එහෙත් ජල උල්පත ආශ්‍රිතව පිහිටි නිතුලේතැන්න, පිටවල ආදී කුඹුරු අස්වැද්දීම සඳහා මෙම මූලාශ්‍රය යොදාගත් බවට අදහසක් පවතී. ඒ අනුව ඓතිහාසික හුරීකඩුව ගල්පිහිල්ල කලාපීය ආර්ථික, ආගමික, සමාජීය වටිනාකම් සහිත සංස්කෘතික උරුම එකතුවක් ලෙස හැඳින්විය හැකිය.

**මුඛ්‍ය පද :** හුරීකඩුව ග්‍රාමය, ගල්පිහිල්ල, ජලාශ්‍රිත ශිෂ්ටාචාරය, ජනශ්‍රැති, සංස්කෘතික වටිනාකම්

[1]ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. hiruniherathabeysekara@gmail.com